ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2020 ජූලි 24 |

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2019 සහ 2020 වසර වලදී මූල්‍ය ආයතන සඳහා දණ්ඩන පැනවීම**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19 (2) සහ 19 (1) වගන්තිය මගින් පැවරී ඇති බලතල අනුව, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදනවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කරන ආයතන සඳහා මූල්‍යමය දණ්ඩන පැනවිය හැක. මූල්‍ය ආයතන හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් සිදුකරන අදාළ අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බැරෑරුම්කම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, රටේ මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2019 වසර තුළදී රුපියල් මිලියන 5 ක හා 2020 මැයි මස 31 දක්වා රුපියල් මිලියනයක සමස්ත දඩ මුදල් පනවන ලදී. මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් මෙරට අනුකූලතා මට්ටම වැඩිදියුණු කිරීමේ අරමුණින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතන වෙත පනවන ලද දණ්ඩන ප්‍රකාශයට පත් කිරීමට 2020 ජූලි මස 01 දින පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේදී තීරණය කෙරිණි.

ප්‍රධාන වශයෙන්, තෙවන පාර්ශව තැන්පතු, දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සඳහා අනුමැතිය ලබා ගැනීම, සම්බාධකවලට අදාළ පිරික්සුම් කිරීම සම්බන්ධයෙන් 2016 අංක 1 දරන මූල්‍ය ආයතන රීති සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 6 වන වගන්තිය යටතේ මුදල් ගනුදෙනු වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන නීති උල්ලංඝනය කිරීම් සඳහා දණ්ඩන පනවන ලදී.

2019/2020 වසරවලදී මූල්‍ය බුද්ධි ඒකකය විසින් පනවන ලද දණ්ඩන පිළිබඳ විස්තර පහත පරිදි වේ;

| දිනය | ආයතනය | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| 2019 ජූලි 29 | ලංකා බැංකුව | 3,000,000.00 |
| 2019 සැප්තැම්බර් 03 | නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී | 1,000,000.00 |
| 2019 ඔක්තෝම්බර් 24 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී | 1,000,000.00 |
| 2020 පෙබරවාරි 19 | සර්වෝදය ඩිවලොප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ් | 500,000.00 |
| 2020 මැයි 18 | යූ බී ෆයිනෑන්ස් ලිමිටඩ් | 500,000.00 |